# කම්කරු දෙපාර්තමේන්තුව

## රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ I, II හා III ශ්‍රේණි සඳහා වන පළමු, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022 අප්‍රේල්

ඉහත තනතුර සඳහා වන අංක 1875/39 හා 2014.08.15 දිනැති රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ.රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව එම සේවයේ I , II හා III ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පළමු, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022 අප්‍රේල් මාසයේ දී කම්කරු දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම පරීක්ෂණය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ වාචික පරීක්ෂණයකි.

### 01 පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)

III වන ශ්‍රේණියට පත්වී වසර 03 ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

#### 1.1 විභාගය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| I. නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 50 | 20 |
| II. වාචික පරීක්ෂණය | 50 | 20 |
| III. එකතුව | 100 | 40 % |

#### 1.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| වාචික පරීක්ෂණය<br>1.ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම<br>2.රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, අතිකාල දීමනා , නිවාඩු , දුම්රිය බලපත්‍ර, ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය<br>• මෝටර් රථ රියදුරන් ගේ රාජකාරී සහ වගකීම<br>• රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරුගේ වගකීම<br>• දෛනික ධාවන සටහන් පොත<br>• වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>• වාහන අලුත්වැඩියාව හා සේවා කටයුතු<br>• රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග |

## 02 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)

II වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර 03 ගතවීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

### 2.1 විභාග පිළිබඳ විස්තරය

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | | |
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| 2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40 % |

### 2.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගතවූ සේවා කාලය තුළ සිදු වී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සිදු කරයි. |

## 03 තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)

I වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර 05 ගතවීමට පෙර තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

### 3.1 විභාග පිළිබඳ විස්තරය

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| 2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40 % |

### 3.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශ |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දැනුමට අමතරව නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජොෂ්ඨතාවයට ගැළපෙන පරිදි වර්ධනය වී ඇත්ද යන්න හා නිලධාරියා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගෙන ඇත්ද යන්න මැන බැලීම සිදු කෙරේ. |

### 04. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

මෙම පරීක්ෂණ සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂයින් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **<u>2022 අප්‍රේල් මස 08 දින හෝ ඊට ප්‍රථම</u>** කම්කරු කොමසාරිස් (පාලන), කම්කරු දෙපාර්තමේන්තුව, තැ.පෙ. 575, කොළඹ 05 ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **<u>ඒකාබද්ධ රියදුරු සේවයේ I , II හා III ශ්‍රේණි සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022 ”</u>** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**05. විභාගයට පෙනී සිටීමට සුදුසුකම් :**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**06. පරීක්ෂණය පැවැත්වීම :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත වාචික පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව දන්වා එවනු ලැබේ.

**07.** විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

එච්.ටී.පී. අබයරත්න
...ම්කරු කොමසාරිස් (පාලන)
...ම්කරු දෙපාර්තමේන්තුව

එච්.ටී.පී. අබයරත්න
කම්කරු කොමසාරිස් (පාලන)

අත්/කළේ: බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

දිනය: 2022.03. 18

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**කම්කරු දෙපාර්තමේන්තුව**

**<u>ඒකාබද්ධ රියදුරු සේවයේ I , II හා III ශ්‍රේණි වල සේවක මහතුන් සඳහා වන</u>**

**<u>පළමු, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022</u>**

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : (සිංහලෙන්) ..............................................................

..............................................................................................................................

1.2 සම්පූර්ණ නම : (සිංහලෙන්) ................................................................................

..............................................................................................................................

02. 2.1 තනතුර හා ශ්‍රේණිය ..........................................................................................

2.2 (අ) III ශ්‍රේණියට පත්වූ දිනය : ..............................................

(ආ) II ශ්‍රේණියට උසස් වූ දිනය : ..............................................

(ඇ) I ශ්‍රේණියට උසස් වූ දිනය : ..............................................

(අදාළ ශ්‍රේණිය පමණක් සම්පූර්ණ කරන්න)

03 3.1 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය: ..............................................................

..............................................................................................................................

3.2 දුරකථන අංක : රාජකාරී : [ ] පුද්ගලික : [ ]

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

4.2 උපන් දිනය : [ | | | ] [ | ] [ | ]

4.3 ස්ත්‍රී පුරුෂ භාවය : [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

5.2 පෙනී සිටීමට බලාපොරොත්තු වන විභාගය : [ ]

06. අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියලුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය : අයදුම්කරුගේ අත්සන

07. **කාර්යාල/අංශ ප්‍රධානියාගේ නිර්දේශය :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා මෙම කාර්යාලයේ/අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :

කාර්යාල/අංශ ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව

08. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය:

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන